# පණ නම් තණ අග පිණි බිඳු වැන්නේ ?

පණ නම් තණ අග පිණි බිඳු වැන්නේ
ලෝ වැඩ සඟරා කිවිඳු ලියන්නේ
සත්තකි පිණි බිඳු නැත පවතින්නේ
ඇති තෙක් පිණි බිඳු අසිරි මවන්නේ

රෑ කල අහසේ තරු බබළන්නේ
රෑ ගන අඳුරේ බිමට වඩින්නේ
වා තල ජීවය කැටිකොට ලන්නේ
සීතල උදයේ පිණි බිඳු වන්නේ

පායන දිනිඳුට ඔමරි කරන්නේ
පීදෙන මල පිට පින්න නටන්නේ
මිණි කැට මුතු ඇට සේ දිදුලන්නේ
දිවියේ මහිමය එලෙස දකින්නේ

ඇත නැත පරලොව කවුරුද දන්නේ
මළ ගිය කිසිවකු නැත යලි එන්නේ
හෙට පරලොව ගැන කුමට තැවෙන්නේ
ඇති තෙක් පණ නල මිහිර විඳින්නේ

සෙනෙහස කැටිවී කිරට හැරෙන්නේ
බිළිඳු දෙතොල මත අම බිඳු වන්නේ
කිරි කැටි බිළිඳුන් පණ රැක දෙන්නේ
පණ නම් තන අග කිරි බිඳු වැන්නේ

*මොරගොඩ මලියසේන,*
*කැන්බරා නුවර, ඕස්ට්‍රේලියාව 16-06-2010*

පන නම් තන අග පිණි බිඳු වැන්නේ
කියුමෙන් අප හට කුමක් සිතෙන්නේ
පනහේ දශකයෙ මෙය සිදු වන්නේ
න-ණ ල-ළ භේදය නැතැයි කියන්නේ

මෙම භේදය නම් නැත සලකන්නේ
එසේ කිරීමට නොපැකිලි වන්නේ
ඇවැසි තැනදි එය ඉබේම වන්නේ
නිවැරිදි එය යැයි ඔවුන් කියන්නේ

සමහර උගතුන් මෙසේ සිතන්නේ
නවක අදහසක් අප හට දෙන්නේ
හෙල බස මෙය යැයි ප්‍රකාශ වන්නේ
භාවිතයෙදි ඉන් පැන මතු වන්නේ

පණ නම් තණ අග පිණි බිඳු වැන්නේ
කොල පාටින් එය අවට පෙනෙන්නේ
තැනින් තැනින් සුදු බින්දු දිලෙන්නේ
මනහර දසුනකි ඉන් හට ගන්නේ

හිම්දිරි යෙදි මයි පිණි දිස්වන්නේ
සිහිලැල් බවකුයි ගතට දැනෙන්නේ
ගතත් සිතත් ඉන් නැලැවී යන්නේ
හිරු නැගුමට පෙර එය සිදු වන්නේ

පන නම් තන අග පිණි බිඳු වැන්නේ
මෙම පිණිබිඳු මුත් සුදු පැහැ ගන්නේ
මවගේ ලේ කිරි බවට හැරෙන්නේ
බිළිඳුට එයමයි පණ නල දෙන්නේ

නාරි ලතා රූපය දිස් වන්නේ
හැඩ වැඩයෙන් එය අපට පෙනෙන්නේ
තරුණියනගෙ ලස්සන වැඩි වන්නේ
ලඳකගෙ සිරියක් මින් පල වන්නේ

සීගිරි සිතුවම් මතකෙට එන්නේ
ලලනාවන් හට මුල් තැන දෙන්නේ
චමත් කාරයක් සිතට නැගෙන්නේ
ලොව මිනිසුන් මෙහි සිරි නරඹන්නේ

ළදකට සිරියක් වූ බව ඇත්තයි
තරුණ රුවිය ඉන් පහස ලබන්නයි
එනමුදු සුවිසල් මෙහෙයක් වන්නයි
බිළිඳුගෙ කුසගිනි මෙයින් නිවෙන්නයි

බිළිඳා කිරි බී හොඳට වැඩෙන්නයි
වැඩි විය පත් ඔහු ලොවක් සදන්නයි
ලොවට වැඩක් කර ජීවත් වන්නයි
පණ නම් තණ අග පිණි බිඳු වැන්නයි

*පාලිත මංචනායක,*
*සිඩ්නි, ඕස්ට්‍රේලියාව 17-06-2010*

එකෙක් පරයමින් හිමිදිරි පින්නේ
තවෙකෙක් කුර ගසමින් තණ කන්නේ
රැසක් පබළු තණ අග දිලිසෙන්නේ
කටක් පුරා දිය බිඳුත් ලැබෙන්නේ

මලක් අගින් පෙරෙනා පැණි ගන්නේ
හළක් තුළින් පැහිලා පෙන ලන්නේ
රැයක් පුරා වියැළුන තන කන්නේ
අයෙක් සුරාවෙන් නටත් කියන්නේ

කලියුග කාලේ අරුම දැනෙන්නේ
රුවට දිළෙන්නලු බුරුළු තනන්නේ
පුම්බන පිම්බෙන කර්ම කරන්නේ
කිරි නැති හින්දලු ගොන් කිරි දෙන්නේ

පුරවන් හද තුළ දුක බිළිඳුන්නේ
කළුවන් කළු කියලා නළවන්නේ
පුළුවන් අය දෙන ගුටි බැට කන්නේ
දරුවන් වෙනුවෙනි කිරට හඬන්නේ

කය නම් වාත්තු කෙරුවා වැන්නේ
කිරි නම් තන අග අග-හිඟ වන්නේ
මෙය නම් නොපමාවම දැන ගන්නේ
පණ නම් තණ අග පිනි බිඳු වැන්නේ’

ඥාණතිලක හේවාගමගේ
සිඩ්නි, ඕස්ට්‍රේලියාව 21-06-2010

පෙරදා කිවිඳුගෙ මනසේ සොබනිය
සැමදා ඔබ හට සිහින මවන්නිය
කිසිදා මෙය ගැන වාද නොවන්නිය
නැති දා කිරි සුග පණද සැලෙන්නිය

*හේමසිරි සුබසිංහ,*
*අබු ඩාබි 26-06-2010*

පණ නම් තණ අග පිණි බිඳු වැන්නේ
හිරු දුටු විට පිණි නැති වී යන්නේ
පින්නේ පැවතුම එපමණි වන්නේ
කාලය හනිකව වියැකී යන්නේ

අපගේ පණ නම් පිණි බිඳු වැන්නේ
පණ ඇති කාලය සීමිත වන්නේ
සීමිත කාලෙදි වැඩ කර ගන්නේ
නිවනට කටයුතු දෑ කර ගන්නේ

හිරු දුටු විට පිණි නැති වී යන්නේ
මරු පැමුණුන විට පණ කොහි යන්නේ
ඊලඟ දිනයෙත් පිණි ඇති වන්නේ
පුනර්භවයකින් යලි පණ එන්නේ

ජීවිත අපගේ මෙලෙසයි වෙන්නේ
මිනිස් පැවැත්මත් එහෙමයි වෙන්නේ
ඊයේ පිණි මද? යළි අද එන්නේ
මියගිය පණ මද? ආයෙත් එන්නේ

ඒ පිළිබඳ නම් තර්ක තිබෙන්නේ
සමහරු කියනුයෙ නැත උන් එන්නේ
බොදු ආකල්පය සිතට නැඟෙන්නේ
පෙර-භව පසු-භව ඇතැයි සිතෙන්නේ

බණ නම් නිබොරුය මුනිවරයින්නේ
කය නම් නොතිරය අදහා ගන්නේ
පණ නම් තණ අග පිණි බිඳු වැන්නේ
පින නම් නොපමාවම කර ගන්නේ

වීදාගම හිමි මෙලෙස කියන්නේ
තේරුම් ඇතිවයි හිමි පවසන්නේ
අද අද එයි මරු පින් කර ගන්නේ
කුමටද කුසලට කම්මැලි වන්නේ?

පාලිත මංචනායක,
සිඩ්නි, ඕස්ට්‍රේලියාව 28-06-2010

තණ අග පිණි බිඳු නැත පවතින්නේ
වැසි බුබුලක් දිය මත පාවෙන්නේ
පන අපෙ මේවට සම කරමින්නේ
හෙල දිව කවියගෙ කවි ලියවෙන්නේ

තණ මත පිණි බිඳු මෙකල මිදෙන්නේ
හිමිදිරි යාමෙට සුදට පෙනෙන්නේ
ඉර නැග එන කල මෙය දියවෙන්නේ
පන ටික එතකන් අල්ලන් ඉන්නේ

ඇති නැති පරලොව ගැන අපි දන්නේ
එහි ගොස් ඇවිද ද මත දොඩ වන්නේ
හෙට දිනයක් ගැන කවුද සිතන්නේ
අද ගැන සිතලා සැපය විදින්නේ

නෙළුම් කොලේ නැත පින්න රැඳෙන්නේ
රැඳුනොත් පිණි බිඳු බට්වියො බොන්නේ
බඩගිනි ආ කල බබා අඬන්නේ
ඒ ඇසු මව් ලේ කිරට හැරෙන්නේ

ලාල් වරුසවිතාන,
කැන්බරා නුවර, ඕස්ට්‍රේලියාව 28-06-2010

ඊයේ පිණි මද? අද මතු වන්නේ
මියගිය පණ මද? ආයෙත් එන්නේ
අළුත්ම පින්නකි අද ඇති වන්නේ
මියගිය පණ නම් නැත යළි එන්නේ

බොදු අප නම් එය එසේ සිතන්නේ
මැරුණු අයෙක් නම් නැත පණ එන්නේ
ජේසු තුමා නම් නැඟිට සිටින්නේ
පාස්කු ඉරිදා එය සිදු වන්නේ

ලොවෙහි අරුමයක් යැයි කියැවෙන්නේ
මළවුන් නැඟුටුන දිනැයි කියන්නේ
ලොකු සතුටක් නම් ඉන් ඇති වන්නේ
ප්‍රිය සම්භාෂණ එදින තිබෙන්නේ

පාලිත මංචනායක,
සිඩ්නි, ඕස්ට්‍රේලියාව 29-06-2010

හිරු කැන් තැවරුණ තණ පත් මත්තේ
පිණි බිඳු අමුතුම සිරියකි ගත්තේ
සුරඹුන් රඟනා විට ඒ මත්තේ
ඇයි සියොලඟ දුහුලින් වහ ගත්තේ

රිද්මය අඩුවෙන වැඩි වෙන වාරෙට
සුමුදු දෙපා අත් සොලවා ගානට
පාවෙන කොට මද පවනේ තාලෙට
ඇස් දෙක අදහා ගන්නට බැමට

සෙවනැලි මතුවන විට තුරු වදුලේ
සමු ගැනුමට මෙන් මදහස පතුලේ
එතකොට ණ යන්න ඇනුනා කකුලේ
(දන්තජ න යන්න බාගෙට ඇතුලේ )

ක්‍රිකට් තරඟයකි දැන් තණ තිල්ලේ
ලංකා පිල බැට දේ සැනසිල්ලේ
ඔල්වරසන් නිම නෑ දැගලිල්ලේ
මුතු දෙපොටක් නැටුවා තන නිල්ලේ

ගරු කෙරුවෙන් පේරාදෙණි පන්නේ
නණලළ ගැන නෑ කිසිවක් දන්නේ
දැන් මා ඒ ගැන සිත යොදවන්නේ
කුමටද කුසලට කම්මැලි වන්නේ

නණලළ යෙදුමට නැත මට නැණබල
සිත යොමු කෙරුවා සැදුමට ජලනළ
එනමුත් ඇදුරන් හට වාසිට්වල
කජු කනවා වාගෙයි ඔය නණලළ

පීදෙන ලා තණ පත් දෙන කන්නේ
ඒ තණමයි පිටි කිරට හැරෙන්නේ
පිටි කිරි තන කිරි වෙනුවට දෙන්නේ
තණ නම් තන අග කිරි බිඳු වැන්නේ

පිටි කිරි බීලා බිළිඳු වැඩෙන්නේ
කිරි මව ගොනු බව නැතිවද ? දන්නේ
කිරි මව් ගතිදෝ උන් අරගන්නේ ?
එකද ? අද ගොං කං වැඩිවෙන්නේ

විපිත අඹදෙණිය,
කැන්බරා, ඕස්ට්‍රේලියාව 30-06-2010

කිරි මව ගොනු බව නැතිවයි දන්නේ
'කව් ඇන්ඩ් ගේට්'මයි දරුවට දෙන්නේ
දෙන ගේ ගතිගුණ බිළිදට එන්නේ
ගොං කං එකයි අද වැඩි වන්නේ

අම්මා වරු දැන් මව් කිරි දෙනවද?
මවගේ හැඩරුව ඉන් කෙලෙසෙනවද?
සොබා දහම මින් අඩුවී යනවද?
මනුස්සකම් අපෙ නැති වී යනවද?

පාලිත මංචනායක,
සිඩ්නි, ඕස්ට්‍රේලියාව 01-07-2010

මොළ වැඩි හින්දලු පිත නැග එන්නේ
මව් කිරි වලටලු එය වැඩි වන්නේ
ඒකලු ගොන් කිරි නියම කරන්නේ
මේ ආරංචිය ඊයෙයි දන්නේ

කිරි මුට්ටිය උඩු ගං පීනන්නේ
ගොන් කිරි රසයයි රසදිව දන්නේ
උම්බෑ කියලයි දරු නළවන්නේ
මෙහෙව් අයටනේ ශිල්ප සැදෙන්නේ

තව කරුණක් මේ ලෙස අඟවන්නේ
ගෙදර බුදුන් නොවැ මව් කිරි දෙන්නේ
රන් කිරි බිඳුවේ ගුණ සිහිවන්නේ
ඒකලු බොදු දන වෙහෙර වඳින්නේ

ද්‍රෝණතිලක හේවාගමගේ
සිඩ්නි, ඕස්ට්‍රේලියාව 01-07-2010

පණ නම් තණ අග පිණි බිඳු වැන්නේ
සිතනා කවුරුද සතුටින් ඉන්නේ
මෙලොවෙහි සැප නැත එලොව තියෙන්නේ
නොදකින ලොවකට සිහින මවන්නේ

ප්‍රියන්ත ප්‍රනාන්දු
කැන්බරා, ඕස්ට්‍රේලියාව 06-07-2010

රණ බිම් වල සෙබළුන් ජය ගන්නේ
තණ බිම් වල ගවයින් හිනැහෙන්නේ
තන නම් දෙනෙතට පිණි බිඳු වැන්නේ
මිනිසුන් නැති දා තන තනි වෙන්නේ

මෛත්‍රී පනාගොඩ,
සිඩ්නි, ඕස්ට්‍රේලියාව 08-07-2010

තන තනි උනාට බියක් නොවන්නේ
එකෙකුගෙ තනියට අනෙකා ඉන්නේ
තන රැකුමට තනපටි ත් තියෙන්නේ
මිනිසුන්ගෙන් මයි උවදුරු වෙන්නේ

පාලිත මංචනායක,
සිඩ්නි, ඕස්ට්‍රේලියාව 08-07-2010

මව් කිරි උරුම අප කිරි කැටි බිළිඳුන්ට
එළ කිරි උරුම එළදෙනගේ පැටියන්ට
මව් කිරි ඇතත් ගොන් කිරි පිටි දුන් අයට
කාලය එලැඹිලා මේ ගැන සිතන්නට

රැවට දිලෙන්නට ලොකුවට තිබුනාට
කිරි බිඳු නොම එරෙයි හැමගේ තන අගට
සුදු වැස්සියන් හට මෙය ඇත උතුරන්ට
එහෙම වුනේ උන් පෙර දා කළ පිනට

පිණිදු ලෙසින් පන නල අපෙ පෙනුනාට
සුවිසල් මැදුරු ඉදිවෙයි අහසක් උසට
මහ මග වැටී පන අල්ලන දුගියන්ට
දෙවියන් වත් වේවිද උන් හට පිහිට

පියසිරි දියලගොඩ
කැන්බරා, ඕස්ට්‍රේලියාව 08-07-2010

අම්මගෙ තනේ කිරි රස කර බිවු හින්දා
තනයක් දුටු විටදි හිත ගැස්සෙනු ඇයි මන්දා
එහි රස බලන්නට හිත දඟලන හින්දා
නොබලමි තනේ දෙස හිත කෙලෙසුන් රන්දා

නැක් පෙරේරා
කැන්බරා, ඕස්ට්‍රේලියාව 08-07-2010

ලලනාවන් අප මහ මග යන්නේ
දුටු දුටු තරුණන් නොමඟයි යන්නේ
දැන දැන ඔවුනුත් කලබල වන්නේ
කෙලෙස් රාගයෙන් අනාථ වන්නේ

අප සංවාදය දුර දිග යන්නේ
නණ - ලළ භේදය නිසා නොවන්නේ
පණ නම් තණ අග පිණි බිඳු වැන්නේ
සැමටම තුති මෙය හමාර වන්නේ

පාලිත මංචනායක,
සිඩ්නි, ඕස්ට්‍රේලියාව 08-07-2010